# පුරප්පාඩු

## විගණන සහකාර තනතුර

## (ස්ථිර / කොන්ත්‍රාත්)

**වසර 30 පුරා තේ නිෂ්පාදන ක්ෂේත්‍රයේ විශිෂ්ඨයකු ලෙස නම් දරා සිටින සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගමේ විගණන සහකාර තනතුර සඳහා සුදුසුකම්ලත් ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.**

**සුදුසුකම් හා පළපුරුද්ද**

**බාහිර අයදුම්කරුවන්**

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සා. පෙළ) විභාගයේදි,

I. සිංහල/ දෙමළ
II. ගණිතය
III. ඉංග්‍රීසි

යන විෂයන් ඇතුළුව විෂයන් හතරක (04) ට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයන් හයකින් (06) සමත්ව තිබීම.

සහ

අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදි වාණිජ්‍ය විෂය ධාරාවෙන් අවම වශයෙන් විෂයන් තුනක් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තිබීම.

සහ

පරිගණක භාවිතය පිළිබඳ (MS Office Package) පාඨමාලාවක් හදාරා තිබීම.

**අභ්‍යන්තර අයදුම්කරුවන්**

(අ) ප්‍රාථමික ශ්‍රේණිය - ශිල්පීය නොවන සහ ශිල්පීය සේවා ගණයන්හි පහත “ආ”, “ඇ”, “ඈ” සහ “ඉ” සඳහන් සුදුසුකම් ඇති සේවකයින්ට මෙ සඳහා අයදුම් කළහැකිය.

(ආ) අධ්‍යාපන පොදු සහතිකපත්‍ර ( සාමාන්‍ය පෙළ) විභාගයේදි,

I. සිංහල/ දෙමළ
II. ගණිතය
III. ඉංග්‍රීසි

යන විෂයන් ඇතුළුව විෂයන් හතරක (04) ට සම්මාන සාමාර්ථයන් සහිතව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් හයකින් (06) සමත්ව තිබීම.

(ඇ) පරිගණක භාවිතය පිළිබඳ (MS Office Package) පාඨමාලාවක් හදාරා තිබීම.

(ඈ) සේවයෙහි ස්ථිර පත්වීම් දැරිය යුතු අතර එම පත්වීම්වල ස්ථිර කරනු ලැබිය යුතුය.

(ඉ) නියමිත දිනට පූර්වාසන්නව ස්ථිර පත්වීමක යටත් පිරිසෙන් අවුරුදු 05 ක අඛණ්ඩ සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබිය යුතුය.

**වයස**

අවුරුදු 18 ට නොඅඩු සහ අවුරුදු 45 ට නොවැඩි අය විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාළ නොවේ.

**මාසික වැටුප් පරිමාණය**

කළමනාකරන සේවා 2/2016 චක්‍රලේඛනය අනුව වැටුප් හා දීමනා ගෙවනු ලැබේ.

MA 1 - 1 රු. 27,910/- 10 x 300/- 7 x 350/- 4 x 495/- 20 x 660/- 48,540/-

වැටුපට අමතරව ජීවන වියදම් දීමනාව රු. 17,800.00 ක්, රජයේ අනුමත දීමනාව රු. 5,000.00 ක් හා ප්‍රවාහන දීමනාව රු. 6,000.00 ක් හිමි වේ.

**අනෙකුත් වරප්‍රසාද**

- වාර්ෂික ප්‍රසාද දීමනා
- ආකර්ශනීය වෛද්‍ය රක්ෂණාවරණයක් (පවුලේ සාමාජිකයින් ඇතුළුව)
- සේවක අර්ථසාධක අරමුදල් හා සේවක භාරකාර අරමුදල්
- මාසික තේ කොළ දීමනාව
- සේවකයින් වෙත ලබා දෙන අනෙකුත් දීමනා සහ වරප්‍රසාද

ඔබගේ අයදුම්පත ජීව දත්ත සමඟ අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම් සහ පළපුරුද්ද පිළිබඳ විස්තර ඇතුළත් කර එම සුදුසුකම් සනාථ කල හැකි සහතිකවල පිටපත් සමඟ ඉදිරිපත් කළ යුතුය

තවද, දැනටමත් රජයේ, සංස්ථා, මණ්ඩලවල සේවයේ යෙදීසිටින අයදුම්කරුවන් තම අයදුම්පත් ආයතන ප්‍රධානීන් මගින් එවිය යුතුය.

සෑම අයදුම්කරුවෙක්ම මනා ශරීර සෞඛ්‍යකින් හා ධනාත්මක අදහස්වලින් පිරි ක්‍රියාශීලි අයෙකු විය යුතු අතර, දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමේ හැකියාව තිබිය යුතුය.

පැලවත්ත, බත්තරමුල්ල අවට 15km ඇතුළත පදිංචි පිරිමි අයදුම්කරුවන් සඳහා ප්‍රමුඛතාවය ලබාදෙනු ලැබේ.

තෝරා ගැනීම සඳහා කිනම් අයුරකින් හෝ අනිසි බලපෑම් කිරීම නුසුදුසුකමට හේතු වනු ඇති අතර, අධ්‍යක්ෂක මණ්ඩල තීරණය අවසාන තීරණය වේ.

ඉහත සුදුසුකම් සපුරා ඇති ඔබගේ ආදර්ශ ආකෘතියට (www.kalubowitiyanatea.lk වෙබ් අඩවියෙන් බාගත හැක) අනුව සකස් කරන ලද අයදුම්පත්‍රය 2024.05.15 දිනට ප්‍රථම පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර ලියුම් කවරයේ වම් කෙළවර ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

**සභාපති, සී/ස කළුබෝවිටියාන තේ කර්මාන්තශාලා සමාගම, නො. 53, රත්නායක මාවත, පැලවත්ත, බත්තරමුල්ල**